සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2016

**10 ශ්‍රේණිය** **පෙරදිග සංගීතය**

## ප්‍රායෝගික පරීක්ෂණය

(01) (i) ගුරුවරයා 'ආ' කාරයෙන් ඉදිරිපත් කරන ස්වර ස්ථාපන ගී පාදයේ වචන හඳුනාගෙන නම් කරන්න. (ගුරුවරයාගේ අභිමතය පරිදි නිර්දේශිත ස්වර ස්ථාපන ගීයක් ගායනා කළ හැක.) (ල.05)

(ii) ගුරුවරයා 'ආ' කාරයෙන් ඉදිරිපත්කරන ස්වර අභ්‍යාසයේ මුල් ස්වර හතර හඳුනාගෙන නම් කරන්න. (ගුරුවරයාගේ අභිමත පරිදි ස ප ස්වර අතර සරල ස්වර අභ්‍යාසයක් 'ආ' කාරයෙන් ගායනය කරන්න.) (ල.05)

(iii) ගුරුවරයා වයනු ලබන නිර්දේශිත තබ්ලා පදය හඳුනාගෙන නම් කරන්න. (ල.05)

(iv) ගුරුවරයා ගයනු ලබන නූර්ති ගී / නාඩගම් ගී / නව නාට්‍ය ගී / ග්‍රැමෆෝන් ගී / සරළ ගී අතරින් එකක් පිළිබඳව ඔබ අසා ඇති තොරතුරු (මුල් ගායකයා / නාට්‍ය අධ්‍යක්ෂකයා / නාට්‍යයේ නම / සංගීතය) යන තොරතුරුවලින් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල.05)

(මුළු ලකුණු 20 යි.)

(02) විෂය නිර්දේශයට අයත් භෛරවී යමන් රාග අතරින් කැමති රාගයක සර්ගම් හෝ මධ්‍යලය ගීයක් පහත සඳහන් කරුණු ඇතුළත් වන සේ ගායනය හෝ වාදනය කරන්න.

- ආරෝහණ (ල.03)
- අවරෝහණ (ල.03)
- ස්ථායි (ල.07)
- අන්තරා (ල.07) (ල.20)

(03) ආඝාතාත්මක හෝ අනාඝාතාත්මක ජන ගීයක් ගායනය හෝ වාදනය කරන්න. (ල.20)

(04) කපිරිඤ්ඤා ගී / චිත්‍රපට ගී / ග්‍රැමෆෝන් ගී වලින් එක් ගී වර්ගයක් ගායනය හෝ වාදනය කරන්න. (ල.20)

(05) (i) ගුරුවරයා නම් කරනු ලබන තාල පදයන් අතින් තාල දමා නිරූපණය කරන්න. (ජප් තාලය / ත්‍රිතාලය / දීප් චන්දි තාලය) (ල.05)

(ii) ස්වර පුවරු සංගීත භාණ්ඩයකින් මධ්‍යලය ගී / සර්ගම් ගී / නූර්ති ගී / නාඩගම් ගී / සරල ගී යන ගී වර්ග වලින් එක් ගී වර්ගයක අනු ගී වාදනය ඉදිරිපත් කරන්න. (ල.05)

(06) ස්වර වාද්‍ය භාණ්ඩයකින් මධ්‍යලය ගී / සරගම් ගී / නූර්ති ගී / නාඩගම් ගී / සරල ගී / ග්‍රැමෆෝන් ගී යන ගී වර්ග වලින් එකක් වාදනය කරන්න. (බටනලා, සිතාර්, වයලින්, දිල්රුබා ආදී ස්වර වාද්‍ය භාණ්ඩ.)

හෝ

තබ්ලාව වාදනය කරන්නේනම් කායදාවක් හෝ යේකාවක් වාදනය කරන්න. (ල.10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(3) | 3 -(1) | 4 -(4) | 5 -(1) | 6 -(1) | 7 -(4) | 8 -(1) | 9 -(2) | 10 -(4) |
| 11-(1) | 12 -(2) | 13 -(3) | 14 -(1) | 15 -(3) | 16 -(3) | 17 -(4) | 18 -(2) | 19 -(1) | 20 -(3) |
| 21-(4) | 22 -(4) | 23 -(2) | 24 -(2) | 25 -(4) | 26 -(1) | 27 -(3) | 28 -(4) | 29 -(1) | 30 -(2) |
| 31-(3) | 32 -(4) | 33 -(4) | 34 -(3) | 35 -(1) | 36 -(1) | 37 -(2) | 38 -(2) | 39 -(1) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II පත්‍රය

(01) i. වන්නම්

ii. ගොයම් ගී හා පැල් ගී ආදී වශයෙන් ගී වර්ග දෙකක්.

iii. ගෙ, ක, කි

iv. (Sharp - Flat) (ෂාර්ප් ෆ්ලැට්)

v. මනමේ, කාලගෝල, සිංහබාහු

vi. තබ්ලාව හා බටනලාව

vii. රේඛාව

viii. නිසරිස, සරිගරි, රිගමග, ගමපම, මපධප, පධනිධ, ධනිසංනි, නිසංරිසං

ix. ජප් තාලය

x. සී. දොන් බස්තියන් ජයවීර (ලකුණු 02 × 10 = 20)

(02) i.

| බිලාවල් | කාෆි | යමන් | භෛරවී |
|---|---|---|---|
| • උත්තර භාරතීය සංගීතය හැදෑරීමේදී පළමුවෙන්ම පුහුණු කරනු ලබන ශුද්ධ ස්වරාත්මකන රාගයකි.<br>• ගප... මගමරි...ස | • සප්ජය හා පංචමය වාදී සංවාදී ලෙස යෙදේ.<br>• සස රිරි ගග මම ප | • තීව්‍ර මධ්‍යමය යෙදෙන සම්පූර්ණ ජාතියේ රාගයකි.<br>• නි රි ග ම .... පරි | • දිවා ප්‍රථම ප්‍රහාරයේ ගායනා කරන රාගයකි.<br>• භක්ති රසයෙන් යුත් මෙම රාගය ගායනා වාදයේදී කෝමළ ස්වර 4 ම යොදනු ලැබේ. |

ii. නියමිත මධ්‍ය ලය ගීතය නිවැරදිව ප්‍රස්තාර කර තිබීම. (ලකුණු 04)

iii. ඉහත මධ්‍යලය ගීතයට අදාල තාලය නිවැරදි තාල සංඥා සහිතව ප්‍රස්තාර කර තිබීම. (ලකුණු 02)

(03) i. A සන්තූර් B චෙලෝ C තබ්ලාව D උඩැක්කිය E ගෙජ්ජි F ට්‍රම්පට් (ල. 0.5 × 6 = 03)

ii. බටනලාව /හොරණෑව / සිම්බල් (ලකුණු 1 × 2 = 2)

iii. වයලීනය




සිතාරය




එකක් නිවැරදිව ප්‍රස්තාර කර ඇත්නම් (ලකුණු 05)

(04) දී ඇති මාතෘකා හතරෙන් දෙකකට ලකුණු 05 බැගින් ලකුණු 10 යි.

(05) i. <u>නූර්ති සංගීතය තුළින් බිහි වූ අපගේ සංගීත කලාව</u>

- නූර්ති සංගීතය හින්දුස්ථානි රාගධාරී සංගීතය හා උත්තර භාරතීය තාල ක්‍රමය පදනම් කරගනිමින් නිර්මාණය වී ඇත.
- නූර්ති සංගීතයෙන් අපට එක්වූ හින්දුස්ථානි තාල පද්ධතිය හා වාද්‍ය භාණ්ඩ අපගේ සංගීත කලාව තුළ භාවිතා වේ.
- නූර්ති ගී තුල තාලයෙන් බැහැරව ගයනු ලබන ගීත කොටසක් වන අතර නමින් දොහොරාව නමින් හැඳින්වේ. පසු කලෙක අපගේ සංගීත ක්ෂේත්‍රයට ද එක්විය. එය Adlib නමින් ව්‍යවහාරික සංගීතයේ දී යෙදේ.
- නූර්ති ගීයේ ස්ථායි අන්තරා ආකෘතිය දැකගත හැකිය. අපගේ සරල ගීයක නාදමාලාව ද කොටස් 02 ක් යටතේ නිර්මාණය වෙයි. එනම් Chorus හා Verse යනුවෙනි.

<u>නාඩගම් රංග ශෛලිය ආභාෂය</u>

- දෙබස් ගීතවත් අයුරින් ඉදිරිපත් කිරීම නාඩගම් සම්ප්‍රදායේ දැකිය හැක. මෙය අපගේ නාට්‍ය කලාව තුලද දැකිය හැකිවීම නාඩගම් නාට්‍ය තුළින් ලත් ආභාෂයකි.

  උදාහරණ : සිංහබාහු නාට්‍යය
  මා ප්‍රිය සොඳුර හා දරුවන් දැසට හමුවන තුරු......
  මාගේ සැනසීමක් නැත.......
- චරිත ඉදිරිපත් කිරීමේ දී විවිධ ගමන් තාල භාවිතා කරනු ලැබීම නාඩගම් නාට්‍ය තුළ දැකිය හැකි අතර මෙය අපගේ නාට්‍ය තුලද දැකිය හැක.

  උදාහරණ : මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය
- පොතේ ගුරු චරිතය හා සහායට අත්වැල් ගායක කණ්ඩායමක් සිටීම අපගේ වේදික නාට්‍යය නාඩගම් නාට්‍යය තුළින් ලත් ආභාෂයකි.
- එක් එක් චරිතවලට ආවේණික මද්දල් පද හා අඩු / වැඩි ලෙස ලය භාවිතා කිරීම. (ලකුණු 06)

ii.
- නූර්ති සර්පිනාව, ඩෝලය, වයලීනය, තබ්ලාව
- නාඩගම් සර්පිනාව, හොරණෑව, මද්දලය (ලකුණු 1 × 2 = 2)

iii. නූර්ති උත්තර භාරතීය සංගීතය / හින්දුස්ථානි සංගීතය
නාඩගම් දක්ෂිණ භාරතීය සංගීතය / කර්ණාටක සංගීතය (ලකුණු 1 × 2 = 2)

එක් කෙටි සටහනකට ලකුණු 05 බැගින් ලබාදෙන්න.

(06) i.
1. Tie Notes : මෙම සංකේතය ආරම්භ වූ විභාගයේ මාත්‍රා ගණනත් ඊළඟ විභාගයේ ඇති මාත්‍රා ගණනත් දක්වා නොඩවා හඬ රඳා පවතින සේ ගායනය හෝ වාදනය කිරීම Tie සංකේතයෙන් අර්ථවත් වෙයි.

   උදාහරණ : ස / නිරි
2. Accidentals : අහඹු ලෙස ස්වර වල ඇතිවන වෙනස්කම් ලෙස හැඳින්වේ.

   උදාහරණ : තීව්‍ර ස්වර - Sharp #    කෝමල - Flat - b    ශුද්ධ ස්වර - Natural - #
3. Ledger Lines : අපරදිග ප්‍රස්ථාර ක්‍රමය ඉරි 05 ක් හෝ 10 ක් මත ගොඩ නැගෙන අතර ඉන් අමතරව ස්වරයක් ලිවීමට අවශ්‍ය වූ විට ඒ සඳහා අමතර ඉරි භාවිතා කෙරේ. එසේ යොදනු ලබන අමතර ඉරි Ledger lines ලෙස හැඳින්වේ.

උදාහරණ :




ii.

